# ඔහු ද තනි නොකරමු/ඔහු ගැනත් සංවේදී වෙමු.

පසුගිය දිනක පන්නරයේ තිබුණු "ඇයට ඉඩදෙන්න" ලිපියට, එහි වූ සියල්ල ඉත සිතින් පිළිගනිමින් සුහද ව කරන එකතුකිරීමකි.

---

"පිරිමින් කෙරෙහි අසීමාන්තිකව ලිංගවාදී (සෙක්සිස්ට්) වූ ලෝකයක ජීවත් වන බවක් මට හැඟේ. මා ජීවත් වන සමාජය අසීමාන්තිකව පුරුෂවිරෝධී වී ඇති අතර අනාගතයේ මට පිරිමි දරුවකු ඉපදුණහොත් ඔහු මුහුණදෙන ගැටලු නොතකා හරින සහ ඔහු පිරිමියකු වීම නිසා ම ඔහු ව වැරදිකරුවකු කිරීමට තැත් කරන සමාජයක ඔහුට ජීවත් වන්නට සිදුවනු ඇතැ යි මම බියවෙමි.[1]"

- අ මිසැන්ඩ්‍රිස්ට් කල්චර් (විමෙන් අගේන්ස්ට් ෆෙමිනිසම් වෙබ් අඩවියෙන් ගත් ලිපියක්)

පුරුෂවිරෝධී සමාජයක් මැයෙන් කාන්තා වෙබ් අඩවියක පළකර තිබූ ලිපියක ආරම්භක ඡේදය එසේ විය. කියවන විට සිනහ පහළ වුවත් කාලීන සමාජයේ යථාර්ථය මෙයයි. ඒ ලිපියේ දක්වා තිබූ නිදසුන් පමණක් නොව නැෂනල් කොඇලිෂන් ෆෝ මෙන් වැනි වෙබ් අඩවියක ලිපි ද කියවන විට එය පැහැදිලි වෙයි.

සමාජයේ පැතිර පවතින මෙන් ම පිළිගත් මතය ද වන්නේ ලිංගභාවය හේතුවෙන් පීඩාවට, හිංසනයට, වෙනස්කමට, අසාධාරණයට ලක්විය හැක්කේ කාන්තාවන් ම පමණක් බව ය. එමෙන් ම පිරිමින් විසින් කාන්තාවන් හිංසනයට ලක්වීමක් විනා කාන්තාවන් විසින් පිරිමින් හිංසනයට ලක්වීමක් සිදුවිය නොහැකි බව මට වුව එක්වරම එන අදහසයි. එයට හේතුව සාම්ප්‍රදායිකව ගැහැනියත් පිරිමියාත් ගැන ගොඩනගා ඇති ආකල්පයයි. පිරිමියා ශක්තිමත් ය. ගැහැනුන්ට වඩා ප්‍රචණ්ඩත්වයට බර ය. ලිංගිකව සක්‍රීය ය. ගැහැනිය සංවේදී ය. දුබල ය. මේ ආදී ලෙස ස්ථාපිත ආදර්ශ (ස්ටීරියෝටයිප්ස්) ගොඩනගා තිබේ. නමුත් මෙවැනි සාමාන්‍යකරණයක් කිරීම අවිද්‍යාත්මක මෙන් ම සුලුතර අනන්‍යතාවන් නැතහොත් ජනප්‍රිය නොවන පෞරුෂත්වයන් සහිත අයට හානිකර ද වෙයි.

පිරිමියකු විසින් ස්ත්‍රියක ලිංගික අතවරයකට ලක්කරන විට එය ඇය සිය ලිංගභාවය හේතුවෙන් පීඩාවට පත්වන අවස්ථාවකි. එමෙන් ම ගැහැනියක් සැමියකු විසින් පහර දීමකට ලක්වන විට හෝ ගෘහජීවිතයේ වගකීම් යන ලේබලය යටතේ සිය අපේක්ෂා, සිහින වළදැමීමට සිදුවන විට එම පීඩනයට හේතුව පිරිමියා සතු බලයත් ගැහැනියක් වශයෙන් ඇගේ තත්ත්වයත් ය. පිරිමින් පීඩාවට පත්වන අවස්ථා ගැන පවසන විට ස්ත්‍රීවාදීන් මෙන් ම ඇතැම් කාන්තාවන් ද අසන පවසන්නේ මෙවැනි තත්ත්වයන්ට පිරිමින් පත්විය නොහැකි බව ය. ඒ ඔවුන් සතු ව පීතෘමූලික සමාජයක ඇති බලය නිසා ය. නමුත් මේ කියන ස්ත්‍රීවාදී ව්‍යාපාරවල ම බලපෑම සහ කාන්තාව සුරක්ෂිත කිරීමට, ඇය කෙරෙහි වගකීම් සහගත වීමට සමාජය තුළ ඇති නැඹුරුව ද හේතුවෙන් ම පුරුෂයන් අනාරක්ෂිත වන තත්ත්වයන් ඇති ව තිබේ.

නිදසුනක් ලෙස ලිංගික අතවරයක් කිරීමට තැත් කළේ යැයි චෝදනා කිරීමෙන් පිරිමියකු ව ඕනෑම විටක බරපතල නෛතිකව මෙන් ම සමාජීයව ද හිංසනයට ලක් කළ හැකි ය. ඇතැම් කාන්තාවන් මෙය සිය වාසියට යොදාගනිමින් සිය පෞද්ගලික එදිරිවාදිකම් හෝ අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට ද මෙය යොදාගනිති. කාන්තාවක් සමග මත ගැටුමක් ඇතිවුවද ඇතැම් වැඩිහිටි පිරිමි වහා එය මගහැර යති. ඒ ඇය අසත්‍ය අතවර කිරීමට තැත් කිරීමේ චෝදනාවකින් මතගැටුම පිරිමසා ගත හැකි නිසා ය. තමන්ට ඇති අනාරක්ෂිත තත්ත්වය නිසා ය. එය අසත්‍ය චෝදනාවක් නිසා ගැටලුවක් ඇති නොවනු ඇතැ යි කියන්නියකට පිළිතුර නම් එය අසත්‍ය බව ඔප්පු වන විට පිරිමියාට සිදුවිය යුතු සියල්ල සිදු වී හමාර බව යි. සමාජය ඔහු දෙස බලන්නේ වපර ඇසිනි. චෝදනාවේ ස්වභාවය අනුව නීතියට අනුව ඔහු රක්ෂිත බන්ධනාගාරගත විය හැකි ය.

---

1 *I feel like I live in the world that is extremely sexist... against men. The country I live in has become extremely misandrist, and I am becoming increasing afraid that if I have a son he will grow up in a world that ignores his issues and attempts to make him feel guilty because he is a man.*
http://womenagainstfeminism.com

වරක් ඉරුදින පුවත්පතකට බේරාගනියෝ මැයෙන් ජී. ජී. නන්දනී ලියූ කෙටිකතාවක් මට සිහිපත් වෙයි. එක් කාන්තාවකට තමන් රජයෙන් ගත් ණයක් සම්බන්ධ ව එය එක්රැස් කිරීම භාර නිළධාරියකුගෙන් නිතර නිතර සිහිකැඳවීම් කෙරේ. දිනක් ඔහු පැමිණ ණය තවදුරටත් ලබානොදුනහොත් ගත හැකි නීතිමය පියවර ගන්නා බව දන්වයි. නමුත් ඇයට ගෙවීමට මුදල් නැත. මොහොතක් බලා සිටින ඇය කොණ්ඩය කඩාදමා, ඇඳුම ද ඉරාගන්නේ අනේ එපා. එපා. අතැරපන් වනචරයා. අයියෝ මට මේ මිනිහා කරදර කරනවා. අනේ කවුරුත් නැද්දෝ මාව... මාව බේරගනියෝ  කියා කෑගසමිනි. අවට ගම්වැසි අය එතැනට පැමිණෙති. ඇඳුමද ඉරී සිටින ඇයත් නිළධාරියාත් දකිති. ප්‍රතිඵලය කෙටිකතාකාරියගේ ම වදනින් මෙසේ ය.

"ජානකීගේ හඩට පාරෙ ගිය රංචුවම මේං මිදුලෙ. තව වට පිටාවෙ හිටපු ගෑනු මිනිස්සුත් ආවෙ දුවගෙන. මූං වලත්තයො රාජකාරිය කරනවා කියලා ඇවිදින් මහ දවාල ගෑනුන්ට කරදර කොරන්ට තනන හැටි. ගැට ගහපියව් අල්ලලා. පොලීසියට දැනුං දෙනකං.... කණ්ඩායමේ වැඩිහිටි ඇත්තෙක් කිව්වෙ එහෙම. පිරිස ඔක්කොම පහලොවක් විස්සක් සාක්ෂියට. තව මොන කතාද! සංඛ සර්ව අල්ලලා ගැට ගැහුවෙ පාර අයිනෙ කොහොඹ ගහේ.[2]"

මෙවැනි ආකාරවලින් කෙතරම් පිරිමින් කාන්තාවන් විසින් හිංසනයට පත්කෙරනවා ඇත් ද? අපට ඇගේ බේරාගනියෝ විලාපය නම් ඇසුණි. නමුත් බේරාගත යුතු පුද්ගලයා හඳුනා නොගත්තෙමු. මෙය සමාජ සිද්ධියක් පමණක් නොවේ. අද පවතින තත්ත්වය පෙන්නුම් කරන දෘෂ්ඨාන්තයකි (ඇලිගරි). ගැටගැසූ පිරිමියා තවමත් එතැන ම ය! නීතියට අනුව අතවරයකට ලක් වූ බව කියන අයගේ අනන්‍යතාව හෙළි නොකළ යුතු ය.[3] නමුත් චෝදනාවට ලක්වන අය සම්බන්ධයෙන් එවැන්නක් නැත. ඒ අනුව මෙවැනි සිද්ධියක දී අසත්‍ය චෝදනා නගන්නියගේ අනන්‍යතාව ආරක්ෂා වන අතර නොකළ වරදක් සමග පිරිමියාගේ නම සමාජගත කරනු ඇත.

වරක් සංවාද මණ්ඩපයක එක් විදෙස් කාන්තාවක් අසා තිබුනේ කාන්තාවන් පිරිමින් දෙස අසභනකාරීව බැලීම වැනි ආකාරවලින් නිගරු කරන්නේ දැයි කියා ය. ඒ පිරිමින් කාන්තාවන්ට පමණක් නොව කාන්තාවන් ද පිරිමින්ට ගරු කළ යුතු ය කියූ අයකුට පිළිතුරක් ලෙසිනි. මගී ප්‍රවාහන සේවාවල දී කාන්තාවන් මුහුණදෙන තත්ත්වයන් ගැන අපි සැවොම කතාකරමු. පිරිමින්ගේ අසභනකාරී බැල්මකින් ඔවුන් පීඩාවට පත්වන බව ලියුම්කාරිය ලියා තිබුණි. නමුත් ඉතා තදබද වූ මගී ප්‍රවාහන සේවාවක කරකියාගත දෙයක් නොහැකිකම නිසා තෙරපීමට සිදුවන පිරිමින් ද තමන් දෙස වැරදි වැටහීමකින් නුරුස්නා බැල්මෙන් බලන කාන්තාවන් විසින් පීඩාවට පත්නොවන්නේ ද?

ගෘහස්ත හිංසන සහ සමීප පුද්ගලයකු (පෙම්වතකු හෝ වතියක) විසින් අනෙකා ව වාචික/කායික හිංසනයන්ට පත්කරන අවස්ථා අතර අන්‍යෝන්‍ය නොවන ප්‍රචණ්ඩ සබඳතාවලින් 70%ක් ම අරඹා ඇත්තේ කාන්තාවන් විසින් බව ඇමරිකාවේ සෙන්ටර් ෆෝ ඩිසීස් කන්ට්‍රෝල්හි ආධාර යටතේ කළ සමීක්ෂණයකින් හෙළි වී තිබේ.[4] එවැනි අවස්ථාවල මියගොස් ඇති පිරිමි ප්‍රමාණය එවැනි මුලු මරණ ප්‍රතිශතයෙන් 25%කි. ස්ත්‍රී දූෂණ සහ වෙනත් ප්‍රචණ්ඩත්වයන්ගෙන් ආරක්ෂා වීමට කාන්තාවන්ට දෙනු කියාදෙනු ලැබූ ආරක්ෂක උපක්‍රමයක් (සෙල්ෆ් ඩිෆෙන්ස් ෆෝ විමෙන්) වූයේ ප්‍රහාරකයකුගේ ලිංගේනද්‍රියට (විශේෂයෙන් ම වෘෂණවලට) පහරදෙන ලෙස ය. කවර ක්‍රමයකින් හෝ ආත්මාරක්ෂාව සලසා ගැනීමේ වරදක් නැත. නමුත් යුරෝපීය හා බටහිර රටවල තරුණියන් අතර මෙය කෙතරම් ප්‍රචලිත වී ද යත් ඔවුන් පෙම්වතකු හැරගිය විටත්, හුදෙක් ප්‍රචණ්ඩ නොවන එහෙත් තමාගේ අමනාපයට ලක්වන කරුණක් වෙනුවෙන් පමණක් නොව ඉන් ලැබෙන වින්දනය නිසා ද එය සිදුකර තිබේ. එක් චීන කතක් ඇගේ සැමියාට ඔහු බිම වැටුණු පසුත් 14 වතාවක් ලිංගේන්ද්‍රියට පයින් පහර දෙන වීඩියෝවක් අන්තර්ජාලයේ විය. හේතුව ඔවුන් නගරයේ ගමන් කරද්දී හමු වූ වෙළඳසැලක පලතුරු මිලදී ගත යුතු යැයි ඇය යෝජනා කළ විට මිල වැඩි යැයි කියමින් ඔහු එය ප්‍රතික්ෂේප කළ නිසා ය. ඇමරිකාවේ පිරිමින් කිහිපදෙනෙකු ම බිරියන් විසින් වෘෂණ මිරිකීමෙන් මරණයට ද පත්කර තිබේ. වෛද්‍ය විද්‍යාත්මකව මෙවැනි පහර දීමක ප්‍රතිවිපාකත් ගැහැනියකට මොන ම හේතුවක් නිසාවත් අත වො එසවිය යුතු හෝ කාන්තාවක් පිරිමියකුට පහර දෙන විට ඇය එසේ කරන්නේ නිසැක ව ම කුමක් හෝ අතවරයක් ඇයට සිදුකළ නිසා බව නිගමනය කරන සමාජයක මෙවැනි අවස්ථාවක දී ඇය පිරිමියාගේ කායික අනාරක්ෂිතබව මෙන් සමාජීය අනාරක්ෂිතබව ද එකවර ප්‍රයෝජනයට ගන්නී ය.

---

2 2016 ජනවාරි 6, ඉරිදා ලක්බිම, 36 පිටුව

3 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත – 365 ඇ වගන්තිය

4 www.ajph.org/cgi/content/abstract/97/5/941 (ncfm වෙබ් අඩවියේ ලිපියක උපුටා දක්වා තිබුණි.)

මෙවැනි දේ ලංකාවේ සිදු නොවන බව හෝ ආසියාතික කාන්තාවගේ හැදියාව ගැන මුසා මට නොකියන්න. පෙම්වතකු අමනාප වූ ගැහැනු ළමුන් ඔවුන් සොයා පැමිණ පිට පිට කනට පහර ගසන සම්ප්‍රදායක් ඇති බව මෑතක උසස් පෙළ සිසුවකු මට කී ය. දියුණු ධනේශ්වර රටවල ඉතිහාසය විසින් අනෙක් රටවලට සිය අනාගත ඉතිහාසය කෙබඳු දැයි කියාදෙන බව ට්‍රොට්ස්කි කියා තිබේ. එය අද සිදු නොවේ නම් හෙට සිදුවිය හැකි ය. ස්ත්‍රීවාදය කාන්තාවන් ඔවුන් සිටි ගෞරවණීය තත්ත්වයෙන් බැහැර කර පිරිමින්ගේ පහත් තත්ත්වයට ම ඇද දැමූ ප්‍රැන්සිස් පැනකෙන් යොකේ පවසා තිබේ.[5] නව පරපුර මෙබඳු ය.

පිරිමි දිවිනසාගැනීම් යනු නිහඬ වසංගතයක් බව පුරුෂවිරෝධී සමාජයක් ලිපියේ කතුවරිය කියයි. ගැහැනු ළමුන්ට වඩා පිරිමි ළමුන්ගේ දිවිනසාගැනීමේ අවදානම 3 ගුණයකින් ඉහළ ය. ලංකාවේ ද තරුණයන් අතර දිවිනසාගැනීම් වසරින් වසර වැඩිවන බවත් තරුණයන් ලක්ෂයකින් 23 ක් දිවිනසාගන්නා බවත් වි. වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා පවසා තිබිණි. නමුත් අපි තවමත් පිරිමියාට දේවල් දරාගත හැකි යැයි ද ඔවුන්ට ප්‍රශ්න නැති යැයි ද පවසමින් සිටිමු. ලිංගිකත්ව අධ්‍යාපනයේ දී කවුරුත් පිරිමි දරුවන් ව බැහැර කරති. නමුත් පිරිමි දරුවනට මෙන් නොව ගැහැණු දරුවන් සහ මව අතර ප්‍රමාණවත් සංවාද විෂය සම්බන්ධයෙන් වන බව (අඩු තරමින් ඔවුන්ට සිය ගැටලු පැවසිය හැකි බව) අධ්‍යයනවලින් හෙළි වී තිබේ. මේ සියලු තත්ත්වයන් මෙසේ තිබිය දී ගැහැනු දරුවන් සුරැකීම ගැන මිස පිරිමි දරුවන් ගැන කිසිවෙක් කතා නොකරති.

2018 වසරේ කාන්තා දිනය දා තවමත් කාන්තාවන්ගෙන් ඉවීමේ හැකියාව බලාපොරොත්තු වන බව කියා තිබුණ ලිපියක් විවේචනය කරමින් ඉන්දියානු කතක් ලියා තිබුණේ පිරිමින්ගෙන් පවුලේ අය වෙනුවෙන් වාහන පැදවීම හෝ මුදල් වියදම් කිරීම බලාපොරොත්තු වීම ද විවේචනය විය යුතු නොවේ දැයි කියා ය. වෙනත් වචනවලින් කියනවා ගැහැනුන් පමණක් සාම්ප්‍රදායික රාමුවෙන් මුදවා ගැනීමට තැත් කරන්නේ මන්දැයි කියා ය. රැකියා අවස්ථාවල දී පවා මෙය මෙසේ නොවේ ද? නමුත් විශේෂත්වය වන්නේ සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටින බවට සහ ලිංගභාවය මත සිදුවන වෙනස්කම් තුරන් කිරීමට කටයුතු කරන බවට සපථ කරන ව්‍යාපාර සහ ඒවායේ සිටින්නියන් මේ කිසිවක් සිය අරගලයට අන්තර්ගත කර නොගැනීම ය.

තව බොහෝ කරුණු ඇතත් මෙය මෙතැනින් නවතමි. ස්ත්‍රීවාදී ව්‍යාපාර අද දවසේ නතර විය යුතු බවක් හෝ කාන්තාවන් මුහුණදෙන ගැටලු වෙනුවට දැන් පිරිමි ගැන පමණක් කතාකළ යුතු බවක් මින් කිසිසේත් අදහස් නොකරමි. නමුත් මේ කරුණු ගැනත් අවධානය යොමුවන්නේ නම් යහපත් ය. වැදගත් වන්නේ ස්ත්‍රිය හෝ පිරිමියා නොවේ. (සංයුක්ත නිකායේ සෝමා සූත්‍රය බලන්න.) අප කටයුතු කළ යුත්තේ මේ කිසිවකු සිය ලිංගභාවය හේතුවෙන් පීඩාවට පත් නොවන තත්ත්වයන් ඇති කිරීමට මිස කිසියම් එක් ලිංගිකයන් පිරිසක් වෙනුවෙන් නොවේ.

සචින්ත මදූෂාන්
ගාල්ල

---

2019 දෙසැම්බර් 22 දින ඉරිදා ලංකාදීපයේ තක්සලාව කොටසේ පන්නරය විශේෂාංගය යටතේ මෙහි තිබෙන කාන්තාවන් විසින් සිදුකරන පිරිමි හිංසන ගැන සඳහන් සියල්ල ඉවත් කර "ගැහැනු පිරිමි මල් පලතුරු" මැයෙන් පළ කර තිබුණි. ලිපියට සිදු වූ හිංසනයේ වගකීම එම තීරයේ සංස්කාරක ප්‍රදීප් දසනායක සහෝදරයා සතු ය.

5 *Feminism liberated women from the natural dignity of their sex and turned them into inferior men. - Francis Panken Yockey*